| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/15/06/24 | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.09.02 |

ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
ලේකම් (ප්‍රධාන/ ක්‍රීඩා/ අධ්‍යාපන/ කෘෂිකර්ම/ ධීවර) අමාත්‍යාංශය,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/ සැලසුම්),
දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ප්‍රාදේශීය ලේකම්වරුන්.

<u>**2025 වසර සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.**</u>

2025 වසර සඳහා දකුණු පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ආයතනවලට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ, සේවාවන් සැපයීම හා ඉදිකිරීම් සඳහා ලියාපදිංචි වීමට කැමති සැපයුම්කරුවන් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිකර ගැනීම සඳහා අදාළ පුවත්පත් දැන්වීම 2024.08.30 දිනමිණ, ඩේලි නිවුස්, තිනකරන් යන පුවත්පතවල පළකර ඇත. ඒ අනුව සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලෙස දකුණු පළාත් සභාවේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සැපයුම්කරුවන්ට/ කොන්ත්‍රාත්කරුවන්ට මේ සමග ඉදිරිපත්කර ඇති අයදුම්පත්‍රය සම්පූර්ණකොට 2024.11.15 දිනට පෙර ප්‍රධාන ලේකම් කාර්යාලයට භාර දෙන ලෙස ඔබ ගේ සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කරන ලෙස දන්වමි. **sr.sys.lk** යන වෙබ් අඩවියට පිවිසීමෙන්, **2025 සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය** පිළිබඳ අයදුම්කරුවන්ට අවශ්‍ය තොරතුරු හා අයදුම්පත්‍රය ලබා ගැනීමට හෝ **මාර්ගගත (Online)** ක්‍රමය ඔස්සේ ද ලියාපදිංචි විය හැකිය.

02. එක් සැපයුම්කරුවෙක්/ කොන්ත්‍රාත්කරුවෙක්, එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය. එක් අයදුම්පත්‍රයක් මගින් අයිතම ඕනෑම ප්‍රමාණයක් ලියාපදිංචි කළ හැකි අතර එක් අයිතමයක් සඳහා ලියාපදිංචි ගාස්තුව රු.300/-කි. ඔබ ආයතනයෙන් අදාළ ගාස්තුව ගෙවනුයේ නම්, ඒ සඳහා දකුණු පළාත් සභා ලදුපතක් නිකුත්කර එම මුදල් "විවිධ ආදායම්" ශීර්ෂය (2003-99-00) යටතේ ගිණුම් ගතකර මාසික ගිණුම් සාරාංශය මගින් පළාත් භාණ්ඩාගාරයට වාර්තා කළ යුතුය.

03. අයිතම අංක 17 යටතේ ඇති ඉදිකිරීම් හා කොන්ත්‍රාත් සේවා සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචියේ දී පහත පරිදි ගාස්තු ගෙවිය යුතු අතර මෙයට අමතරව ඉදිකිරීම් හා කොන්ත්‍රාත් සේවා අයිතමයක් සඳහා රු.300/- බැගින් ද ගෙවිය යුතුය.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

1. රු: මිලියන 02ට අඩු කොන්ත්‍රාත් සඳහා (C 9 සහ C 8 ) - රු: 1,000.00
2. රු: මිලියන 02 සිට රු: මිලියන 05 දක්වා (C 8 සහ C 7) - රු: 1,000.00
3. රු: මිලියන 05 සිට රු: මිලියන 10 දක්වා (C 7 සහ C 6) - රු: 2,000.00
4. රු: මිලියන 10 සිට රු: මිලියන 20 දක්වා (C 6 සහ C 5) - රු: 2,000.00

මෙම ලියාපදිංචි කිරීමට අදාළ කොන්දේසි, නියමයන්, අයිතම විස්තර හා අයදුම්පත්‍රය මේ සමග ඔබ ආයතනයට එවන අතර ඔබ ආයතනයට අදාළවන සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් සිටී නම්, එම ආයතන දැනුවත්කර ඔවුන්ට ලියාපදිංචි වීමට අවස්ථාව සලසා දෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි. මෙම අයදුම්පත්‍රය සහ පුවත්පත් දැන්වීම ඔබ ආයතනයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලෙස වැඩි දුරටත් දන්වා සිටිමි.

එන්.එම්. ආනන්ද අමරදේව
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය කළමණාකරන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
දකුණු පළාත.